(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(10).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ජනවාරි 08 සිකුරාදා**

---

**2021 ජනවාරි 19 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 අගෝස්තු 14 දිනැති අංක 2188/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 අගෝස්තු 21 දිනැති අංක 2189/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 සැප්තැම්බර් 03 දිනැති අංක 2191/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 සැප්තැම්බර් 30 දිනැති අංක 2195/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 13 දිනැති අංක 2197/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 2199/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10 වගන්තිය යටතේ, 2021.01.05 දින ඉදිරිපත් කරන ලද ආනයන තීරු බදු සම්බන්ධ යෝජනාව අනුමත කළ යුතු ය.

(2020 සැප්තැම්බර් 21 දිනැති අංක 2194/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2021 පෙබරවාරි 12 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/2020

ගරු හේෂා විතානගේ මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩ සිටින වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩ සිටින වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීම,— රටකට සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේ දී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට සුදුසු යාන්ත්‍රණයක් රජය විසින් සකස්කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2020

ගරු හේෂා විතානගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම,— කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂිකර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගා ජලය විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මගින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේ දී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් රජය විසින් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2020

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ යෝග්‍ය වැඩසටහනක් රජය විසින් ආරම්භ කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්හී දී නිරන්තරයෙන්ම ගංවතුරෙන් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2020

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වානිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යෑමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වාභාවික ආපදා අවම කරගැනීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්වාභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානම් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කර ගැනීම සඳහා වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2020

ගරු හේෂා විතානගේ මහතා,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණයවීම වැළැක්වීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණයවීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශ වන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවැනි වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදාහරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳ විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2020

ගරු හේෂා විතානගේ මහතා,— දහම් පාසැල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ටසම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇතිකිරීම උදෙසා සියලුම දරුවන්ට (11 ශ්‍රේණිය දක්වා) ඔවුන්ගේ ආගමානුකූලව දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2020

ගරු හේෂා විතානගේ මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැඟීම සඳහා දීර්ඝ කාලීනව ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳ අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳ ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයන් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයන් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව සෘජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයන්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මඟින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයින්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.20/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— දුම්රිය මැදිරි දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම,— දුම්රිය දෙපාර්තුමේන්තුව විශාල භෞතික හා මානව සම්පත් වලින් සමන්විත දෙපාර්තුමේන්තුවක් වන හෙයින් ද, මෙරට දුම්රිය මැදිරි විදේශ රටවලින් ආනයනය කිරීමේදී විශාල මුදලක් විදේශ රටවලට ගලා යන හෙයින් ද, එම තත්ත්වය වැළැක්වීමට දුම්රිය මැදිරි මෙරට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/2020

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— ශ්‍රී ලංකාව තුළ තැපැල් සේවය ව්‍යාප්ත කොට තිබෙන නමුත්, වර්තමානය වනවිට වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව සඳහා තැපැල් සේවාව විධිමත් කිරීමක් සිදුවී නොමැති හෙයින් ඔවුන් විවිධ අපහසුතාවන්ට ලක් වී සිටින හෙයින් ද, අවුරුදු එකසිය පනහකට ආසන්න කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2020

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශ වල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2020

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය පිළිගැනීම,— ශ්‍රී ලංකා ඉතිහාසයේ ආර්ථික වර්ධනය සඳහා අතිවිශාල දායකත්වයක් සපයන කඳුරට වතු කම්කරුවන් තම අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ ලබාගෙන ඇති හෙයින්, එවැනි අරගලයන්හි දී දිවිපිදූ වෘත්තීය සමිති විරුවන් පොදු දිනකදී අනුස්මරණය කළ යුතු යැයි ශ්‍රී ලංකාවේ ජීවත්වන ඉන්දීය සම්භවයෙන් යුත් කඳුරට ජනතාවගේ දීර්ඝ කාලීන ඉල්ලීම සලකා බලා ඒ අනුව වාර්ෂිකව ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය සැමරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2020

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම් වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රජයේ සියලු ආයතන රජය සතු ගොඩනැගිලිවල ස්ථානගත කිරීම,— මහජනතාවගේ බදු මුදලින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය ආයතන පෞද්ගලික ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් අනවශ්‍ය ලෙස වියදම් වන හෙයින් ද, එම ආයතන, රාජ්‍ය ගොඩනැගිලි තුළ ස්ථාපිත කිරීමෙන් විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වන හෙයින් ද, සියලුම රාජ්‍ය ආයතන රජය සතු ගොඩනැගිලිවල පමණක් ස්ථාපිත කිරීමට රජය විසින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළෙඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල කසළ බැහැර කිරීම,— ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන බොහොමයක් වර්තමානය වනවිට කසළ බැහැර කිරීමේ වගකීම පෞද්ගලික සමාගම් වෙත භාර දීම හේතුවෙන් බදු ගෙවන ජනතාවගේ විශාල මුදලක් අදාළ සමාගම් වෙත විතැන් වන හෙයින් එම කාර්යය අදාළ පළාත් පාලන ආයතනයේ සේවකයන් යොදවා සිදු කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගොඩගසා ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— බුලත් ගොවීන්ගේ ගැටලු විසඳීම,— වයඹ පළාතේ සැලකිය යුතු පවුල් සංඛ්‍යාවක් බුලත් වගාවේ නිරතව සිටින අතර, වර්තමානය වනවිට එම බුලත් ගොවීන්ට ගැටලු රාශියකට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් එම තත්ත්වය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ පුරන් වූ කුඹුරු අස්වැද්දීම,— රටක සංවර්ධනය සඳහා ආහාරවල සුරක්ෂිතභාවය ඉතා වැදගත් වන හෙයින් වයඹ පළාතේ දැනට පුරන් වී ඇති කුඹුරු යළි අස්වැද්දීම සඳහා කඩිනම් යෝග්‍ය වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම විසඳීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක අලි-මිනිස් ගැටුම ඉතා ප්‍රබලව දක්නට තිබෙන හෙයින් ඒ සඳහා තිරසර විසඳුමක් ලෙස සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීම,— වයඹ පළාතේ විශාල පිරිසක් කෘෂිකර්මාන්තය ආශ්‍රිත රැකියාවල නිරත වන හෙයින් ද, එම ගොවි ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන හෙයින් ද, වයඹ පළාතේ කුඩා වැව් සියල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර කඩිනමින් ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම,— කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ බොහෝ ප්‍රදේශවල පුරාවිද්‍යා ස්ථාන රාශියක් තිබෙන හෙයින් අනාගත පරපුර වෙනුවෙන් ඒවා ආරක්ෂා කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2020

ගරු එච්. නන්දසේන මහතා,— වන සීමා පුළුල් කිරීම හේතුවෙන් ගොවීන්ට වසර ගණනාවක් වගා කළ ඉඩම් අහිමි වීමෙන් සිදුවන හානිය වළකාලීම,— 2001.08.10 දින වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය මඟින් නිකුත් කරනු ලැබූ 5/2001 චක්‍රලේඛය පදනම් කර ගනිමින් වන සීමා පුළුල් කිරීමේදී දීර්ඝ කාලයක් පුරාවට වගා කරන ලද ගොවි බිම්, වන සීමාවට ඇතුළත්වීම හේතුවෙන් එම ගොවි ජනතාවට අසාධාරණයක් සිදුවූ හෙයින් ද, අදාළ නිලධාරීන් වගකීමෙන් කටයුතු කර නොමැති හෙයින් ද, මෙම තත්ත්වයට මුහුණ පා සිටින අසරණ ගොවි ජනතාවට සාධාරණය ඉටුකර දීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2020

ගරු එච්. නන්දසේන මහතා,— රජයේ පාසල්වල වසර 15කට අධික කාලයක් ඉගැන්වීම් කටයුතුවල යෙදී සිටි සිවිල් ආරක්ෂක නිලධාරීන් හට ගුරු පුහුණුව ලබා දී ගුරු සේවයට ඇතුළත් කර ගැනීම,— ත්‍රස්ත ප්‍රහාර උත්සන්නව පැවති සමයේ දී තර්ජිත ගම්මානවල පිහිටි පාසල්වල විශාල ගුරු හිඟයක් පැවති හෙයින්, පාසල් දරුවන් සඳහා ඉගැන්වීම් කටයුතු වර්තමානය දක්වාම සිවිල් ආරක්ෂක නිලධාරීන් පිරිසක් විසින් සිදු කරනු ලැබූ හෙයින් ද, උතුරු නැගෙනහිර පළාත්වල එවන් නිලධාරීන් ගුරු සේවයට ඇතුළත් කරගත් හෙයින් ද, උතුරු මැද පළාතේ සිවිල් ආරක්ෂක නිලධාරීන් ද ගුරු සේවයට ඇතුළත් කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් නිසා ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දේශීය කෘෂි නිෂ්පාදනයේ ඉහළ ඵලදායකත්වය සඳහා වන සතුන්ගෙන් සිදුවන වගා හානි වළක්වා ගැනීම හා වගා හානිපූරණය කිරීම,— සුළු පරිමාණ හා ගෙවතු වගා ලෙස කෘෂිකර්මාන්තයේ නියැලෙන ගොවි ජනතාව වගා කරන සාදික්කා, කරාබු, ගම්මිරිස්, පොල්, විවිධ පලතුරු ආදී ස්ථිර බෝග මෙන්ම, අල, ලූනු, එළවළු, වී ආදි කන්න බෝග වගාවන්ට රිලව්, වල් ඌරන්, ඉත්තෑවන්, අලි ආදී විවිධ වන සතුන්ගෙන් සිදුවන හානි වැලැක්වීම සඳහා අදාළ සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව ජාතික කෘෂි නිෂ්පාදන ආරක්ෂිත ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීමට ද, වන සතුන්ගෙන් සිදුවන වගා හානි සඳහා පූර්ණ වන්දි ලබාදෙන වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට ද, රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— දහම් පාසල් අධ්‍යාපනය දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් සම්පාදනය කිරීම,— දහම් පාසල් අධ්‍යාපනය තුළින් ගුණ දහමෙන් ශික්ෂිත සමාජයක් ගොඩ නැංවීමට පදනම සැකසෙන නමුදු, එම පාසල්වල පවතින භෞතික සම්පත් හිඟය මත ඇතිවෙන දුෂ්කරතා නිසා බොහෝ දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු නොවන හෙයින් රටේ බහුතරයක් දහම් පාසල්වලට අත්‍යවශ්‍ය ඉගෙනුම් මේස, බංකු, ගුරු මේස, ගුරු පුටු, කළුලෑලි, සුදු ලෑලි මෙන්ම, එහි කුඩා දහම් පුස්තකාල සඳහා පොත් අල්මාරි සපයා දීමටත්, දහම් පාසල් දරුවන් සඳහා ළමා සාරිය, ජාතික ඇඳුම වැනි ඇඳුමක් වෙනුවෙන් අවශ්‍ය රෙදි ලබාදීමටත්, පුද්ගලික අංශයේ හා දානපතීන්ගේ දායකත්වය ද සහිතව රජය විසින් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුවක් හා ආර්ථික නායකත්වයක් ගොඩනැඟීම,— ශ්‍රී ලංකාව තුළ අධික පොළියට ක්‍රියාත්මකවන ක්ෂුද්‍රමූල්‍ය ණය, මූල්‍ය සමාගම් ණය, හා කල්බදු ණය උගුලෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ගලවා ගනිමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් නවෝත්පාදන නිෂ්පාදන හා අගය එකතු කරන ව්‍යාපාරවල නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට, කෘෂි නිෂ්පාදකයන්ට හා සේවා සපයන ව්‍යවසායකයන්ට, ලිහිල් කොන්දේසි හා ලිහිල් පොළියකට දිගුකාලීනව ගෙවිය හැකිවන පරිදි මූල්‍ය ණය ලබාදෙන බැංකුවක් ස්ථාපනය කිරීමටත්, රටේ ආර්ථික වර්ධනයට, රැකීරක්ෂා ජනිත කිරීමට හා රටේ සම්පත්වලින් ඉහලම ඵලදායිකත්වයක් ලබාගැනීමට සහය වන ව්‍යවසායක ආර්ථික නායකත්වයක් ගොඩනැඟීමටත්, දැනට ව්‍යවසායකත්ව ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහාය ලබාදෙන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර දේශීය ව්‍යවසායකත්ව සංවර්ධන හා ආර්ථික පුනර්ජීවන කාර්යසාධන බලකායක් ඇති කිරීම උදෙසා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මුල් ළමාවිය සංවර්ධන වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම,— රටක අනාගතයේ සබුද්ධික පුරවැසියකු බිහිවීමට මුල් ළමාවිය සංවර්ධනය පදනම් වන හෙයින් දිවයිනේ පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා මුල් ළමාවිය මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතියකින් පැවැත්විය යුතු බැවින් ද, එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කර, නිසි ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම නියාමනය කිරීමටත්, ඒවා පවත්වාගෙන යන ව්‍යවසායකයන්ට හා කාර්ය මණ්ඩලවලට ජාතික වෘත්තීය නිපුණතා (NVQ) සහතිකපත් තිබීම අනිවාර්ය කිරීමටත්, එවන් මධ්‍යස්ථානවල පැවතිය යුතු

ඉඩකඩ හා යටිතල පහසුකම් පිළිබඳ නිර්දේශ නීතිගත කිරීමටත්, එහි සේවය කරන්නන්ට දායකත්ව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමටත්, දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එවන් මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සහන පොළියට ණය පහසුකම් ලබාදීමටත්, අවශ්‍ය ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට ජාතික මුල් ළමාවිය සංවර්ධන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමට රජය විසින් යෝග්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— විසිඑක්වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි සමූපකාර ව්‍යාපාරයක් බිහිකිරීම,— ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින සමූපකාර ක්‍රමය දැනට අඩ සියවසකට පෙර පත්කරන ලද සමූපකාර ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත කරන ලද්දක් වන හෙයින් ද, මෙම ව්‍යාපාරය විසිඑක්වන සියවසේ තුන්වන දශකයේ අභියෝගවලට මුහුණ දියහැකි එනම්, ආත්මාධාරය, අන්‍යෝන්‍යාධාරය හා සකසුරුවම යන සමූපකාර මූලධර්ම මත පදනම්ව වත්මන් සියවසේ අභියෝග ජය ගැනීමට සමත්, නව තාක්ෂණය භාවිතයෙන් මහා පරිමාණ වෙළෙඳ ජාල සමඟ සාර්ථකව තරඟ කළ හැකි ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධනයටත්, ප්‍රාග්ධන ගැටලුව සහ වෙළෙඳපොළ ගැටලුවලට සාර්ථක විකල්පයක් ලෙසත්, අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයටත් යොදාගත හැකි සුවිශාල වත්කම් ප්‍රමාණයක් හිමි ක්ෂේත්‍රයක් වන හෙයින් ද, වත්මන් සමූපකාර ක්‍රමය ඉහත කී අභිප්‍රායන් සංවර්ධනය කිරීම සඳහා අදාළ නව ප්‍රතිපත්ති හා අණ පනත් සම්පාදනය කොට, සමූපකාර ව්‍යාපාරයේ සැබෑ හිමිකරුවන් වන සමූපකාර කොටස් හිමිකරුවන්ගේ බලය වැඩිකර සමූපකාර ව්‍යාපාරය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක්කිරීමට රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— කාන්තා අයිතීන් සුරැකීම හා කාන්තා අභිවෘද්ධිය සැලසීම,— කාන්තාවන්ගේ කායික, මානසික, සාමාජීය සුරක්ෂිතභාවය හා අභිවෘද්ධිය සැලසීම රටේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයක් වන හෙයින්, කාන්තාවන්ට නිසිලෙස නොසැළකීමට එරෙහිව නඩු විභාගයකින් දඬුවම් පැමිණවීමටත්, කාන්තා හිංසනය, අපයෝජනය, බාලවයස්කාර දැරියන් හෝ කාන්තාවන් දූෂණය කිරීම සම්බන්ධයෙන් ඇප ලබා නොදෙන නීති පැනවීමටත්, පොලීසියේ කාන්තා හා ළමා අංශයේ බලතල පුළුල් කිරීමටත්, නඩත්තු හා දික්කසාද නඩු අප්‍රමාදව විසඳීමට යෝග්‍ය අධිකරණ ක්‍රියාවලියක් ඇති කිරීමටත්, බස් රථවල කාන්තාවන් සඳහා එක් පසක අසුන් පෙළක් වෙන් කිරීමටත්, ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල සූරාකෑමට හසුවන්නන්ගේ ණය කපා හැරීමට නීති පැනවීමටත්, සෑම නිවසකටම ජලය සහ ඉවුම් පිහුම් සඳහා අඩුවියදම් බලශක්තිය සහතික කිරීමටත්, මුළුතැන්ගෙයි උපකරණ සහන පොළියට ගැනීමට බැංකු පහසුකම් ලබාදීමටත්, වැන්දඹු කාන්තාවන්ට තම ස්වාමිපුරුෂයා ලබමින් සිටි වැටුප ගෙවීම නීතිගත කිරීමටත්, විරැකියා වැන්දඹුවන්ට රජයෙන් යැපුම් දීමනාවක් ලබාදීමටත්, සමාන සේවයට සමාන වැටුප් ලබාදීම නීතිගත කිරීමට හා කාන්තා නිෂ්පාදන අලෙවියට සුදුසු අලෙවි ජාලයක් ගොඩනැඟීමටත් අවශ්‍ය ප්‍රතිපත්ති සහ නීති අණපනත් සෑදීම සඳහා රජය විසින් කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ඉහළ නැංවීම,— මැණික් ඉඩම් හඳුනාගැනීමේ සිට මැණික් වෙළෙඳපොළ අලෙවිය දක්වා කටයුතුවලට විවිධ පාර්ශ්ව සම්බන්ධවීම හා නොයෙකුත් ව්‍යුහයන් ක්‍රියාත්මකවීම සිදුවුවත්, ඒවා අතර අන්තර් සබඳතාවයක් නොමැතිවීම මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ප්‍රගතියට හා සංවර්ධනයට මහත් බාධාවක් වන හෙයින්, මෙම කර්මාන්තයට අදාළ ජාතික ප්‍රමුඛතා ඇතුළත් ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර, කර්මාන්තයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ අන්තර් සබඳතාවය ගොඩනැංවීමටත්, අගය එකතුකරන ලද මැණික් හෝ මැණික් යොදාගත් නිෂ්පාදන දිරිගැන්වීමට බදු සහන ඇතුලු සානුබල ලබාදීමටත්, මැණික් කර්මාන්තයේ නියැලෙන පතල්කරුවන්ගේ ජීවිත අවදානමට මෙන්ම, පතල් මඟින් පරිසරයට සිදුවන හානි පූර්ණය කිරීම සඳහා රක්ෂණ ආවරණයක් ඇතිකිරීමටත්, කැණීම් බලපත්‍රයක් ලබාගැනීම පූර්ණ කොන්දේසියක් ලෙස නීතිගත කිරීමටත්, මැණික් ලාභීන්ට ලැබෙන මුදල් ප්‍රති ආයෝජනය කිරීමට අවස්ථා පුළුල් කිරීමටත්, මැණික් මිලදීගැනීමට පැමිණෙන විදේශිකයන්ට පණවන සීමා ඉවත් කිරීමටත්, මැණික් භාවිතකර අත්කම් නිෂ්පාදන ඇතුළු ගෘහ කර්මාන්තය දක්වා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමටත්, අලෙවිකරණය දක්වා සියලු ක්ෂේත්‍රවලදී නව තාක්ෂණය යොදාගැනීමටත් යෝග්‍ය ප්‍රතිපත්ති සහ අණපනත් සැදීමට රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— සුළු අපනයන බෝග ආර්ථික මධ්‍යස්ථානයක් ඇතුළත් අපනයන කෘෂි බෝග ආශ්‍රිත නවෝත්පාදන කර්මාන්ත කලාපයක් බිහිකිරීම,— අතීතයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සුළු අපනයන බෝගවලට උරුමව පැවති "සිලෝන් ස්පයිස්" යන කීර්ති නාමය යළි ගොඩනඟා ගනිමින් ගෝලීය වෙළෙඳපොළ ජය ගැනීමට සුළු අපනයන බෝග බහුලව නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක පදනම් කරගත් ආර්ථික මධ්‍යස්ථාන ඇතුළත් එම බෝග ආශ්‍රිත අගය එකතු කරන ලද නවෝත්පාදන කර්මාන්ත කලාප බිහි කරන ලෙසත්, මෙම අපනයන නිෂ්පාදන සඳහා දැනට ක්‍රියාත්මක බදු ප්‍රතිපත්තිය සමාලෝචනය කර අපනයන කෘෂි බෝග කර්මාන්තයේ ප්‍රගමනයට අදාළ බදු ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්, සුළු අපනයන බෝග වගාකරුවන් දිරිගැන්වීමට සහනයක් ලෙස අස්වනු අලෙවියෙන් පසු ගෙවීමේ ක්‍රමයට ණය පහසුකම් ලබාදීම සහ ඒ සමඟම වගා රක්ෂණයක් ගොවිමහතුන්ට ලබාදීමේ ක්‍රමෝපායක් ඇතිකිරීමටත් රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— උඩරට නැටුම්, සම්ප්‍රදායික කලා ශිල්ප, ලී කැටයම්, මූර්ති හා ගෘහ නිර්මාණ ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත් කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම,— ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රෞඪත්වය සහ අනන්‍යතාවය විදහාපාන සාම්ප්‍රදායික උඩරට නැටුම් හා කලා ශිල්ප, චිත්‍ර, ලී කැටයම්, මූර්ති සහ ගෘහ නිර්මාණ ශිල්පය අප රටට පමණක් උරුම ඒක දේශීය විරල සංස්කෘතික හා කලා ශිල්ප වන හෙයින්, ඒවා ලෝක උරුමයන් ලෙස ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, එකී උරුමයන් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීමටත්, එම කලා ශිල්ප ආරක්ෂා කරමින් පවත්වාගෙන යන ශිල්පීන්ගේ සමාජ ආර්ථික සංවර්ධනය ඇතිකිරීමටත්, උඩරට උරුමයන් ආරක්ෂා කොට, ප්‍රවර්ධනය කර, විධිමත් ලෙස පාලනය කිරීමට ව්‍යවස්ථාපිත පදනමක් හෝ මණ්ඩලයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/2020

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ශ්‍රී ලංකාවේ විදේශ සේවා කටයුතු ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමෙන් 8%ක් පමණ දායකත්වයක් විදේශගත ශ්‍රම බලකායෙන් ලැබෙන හෙයින්, එම ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විදේශීය ශ්‍රම ඉල්ලුමට සමගාමීව ශ්‍රමිකයන් පුහුණු කරන ආයතනයක් ස්ථාපිත කිරීමටත්, විදේශගත පුරවැසියන්ට ඡන්ද බලය භාවිත කිරීමට අවස්ථාව සලසාදීමටත්, ඔවුන්ට දායක විශ්‍රාම වැටුපක් වැනි සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමටත්, විදේශ සේවය හේතු කොට ගෙන ඇතිවන නොවැළැක්විය හැකි දුර්භාග්‍ය අවස්ථාවල දී මෙන්ම අනතුරු විපත්වල දී වන්දි ලබාදෙන රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ඔවුන්ගේ ඉතුරුම්වලට වැඩි පොලියක් බැංකු මගින් ලබාදීමටත්, නිවාස ඉදිකර ගැනීමට සහන පොලී සහ ණය ලබාදීමටත්, රජයේ රැකියා ලබාදීමේ දී විදේශගත දෙමාපියන්ගේ දරුවන්ට ප්‍රමුඛත්වයක් ලබාදීමටත්, ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් සහ මෙරට හා විදේශීය රැකියා ඒජන්සිවලින් සිදුවන අකටයුතුකම් කඩිනමින් විසඳීමට යෝග්‍ය ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, ශ්‍රමිකයන් ලියාපදිංචියේ දී අයකරන ගාස්තු වලින් හා ගෘහ සේවයට පිටත්වීමේ දී ඒජන්සි ලබාදෙන මුදලින් කොටසක් ලබාගෙන පෙර විගමනික හා පසු විගමනික භාරයක් ඇති කිරීම සඳහාත් රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් දියත් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/2020

ගරු එච්. නන්දසේන මහතා,— වසර 40කට අධික කාලයක් පුරා ස්ථිර නිවාසවල පදිංචිව සිටින (බලපත්‍ර සහිත හෝ රහිත) පදිංචිකරුවන් සඳහා ඉඩම්වල අයිතිය ලබාදීම,— වසර 40කට අධික කාලයක් ස්ථිර නිවාස ඉදිකර ගනිමින් පදිංචිව සිටිය දී පසුකාලීනව වනජීවී ප්‍රදේශ ලෙස ගැසට් කිරීම හෝ ජනතාව දැනුවත්කිරීම නිසා ජයභූමි ඔප්පු හෝ වෙනත් දීමනා පත්‍ර ලැබී තිබුණ ද, සියලුම සංවර්ධන කටයුතු අත්හිටුවීම නිසා පදවිය - කැබතිගොල්ලෑව මාර්ගයේ නිවාස, නගරය හා මූලික රෝහල් භූමිය සහ මිහින්තලය අංක 564 පොතාන තුලානේ නිවාස, සින්නක්කර හෝ පිඹුර සහිත කුඹුරු ඉඩම් හිමි පදිංචිකරුවන්ට තදබල අසාධාරණයක් සිදු වී ඇති හෙයින්, මෙම ඉඩම් නිදහස් කර දීමට අවශ්‍ය කටයුතු රජය විසින් කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/2020

ගරු එච්. නන්දසේන මහතා,— උතුරු මැද පළාතේ සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම,— මූලය හඳුනා නොගත් වකුගඩු රෝගීන් බහුල ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇති උතුරු මැද පළාත තුළ වර්තමානය වනවිට ජල පෙරණ සවිකරමින් තිබෙන හෙයින් ද, එනිසා වැඩිවන රෝගීන් සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවක් දක්නට ඇති හෙයින් ද, සියලුම ගම්මාන සඳහා ප්‍රති ආශ්‍රිත ජල පෙරණ සවිකරදීම කඩිනම් කිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් ඇති කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/2020

ගරු එච්. නන්දසේන මහතා,— සියලුම ගම්මාන සඳහා ඇති ප්‍රධාන පිවිසුම් මාර්ග ස්ථිර මාර්ග ලෙස සංවර්ධනය කිරීම,— දුෂ්කර ප්‍රදේශවල බොහෝ ගම්මාන සඳහා ඇත්තේ එකම පිවිසුම් මාර්ගයක් පමණක් හෙයින් ද, වසර ගණනාවකින් ඒවා සංවර්ධනය කර නොමැති හෙයින් ද, මෙම සියලුම පිවිසුම් මාර්ග කඩිනමින් සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.